**ශීර්ෂය 209 - ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 209 - ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) මූලධන වියදම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය තුළ අඩංගු වෙනත් යන්ත්‍ර හා උපකරණ යටතේ දක්වා තිබූ පරිගණක උපකරණ වල 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.6,171,985 ක් විය. නමුත්, 2022 වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස රු.6,038,585 ක් විය. ඒ අනුව වෙනස රු.133,400 ක් වූ අතර, අදාළ වටිනාකම 2021 මූල්‍ය නොවන වත්කම් යටතේ ඇතුළත් කර නොතිබුණි. අවසාන ශේෂ ලෙස ඉදිරියට ගෙන ගොස් නොතිබූ කෘෂි කාර්මික හා කිරි ගොවිපල උපකරණ (අංක 6112216) යටතේ 2022 ජනවාරි 01දිනට ආරම්භක ශේෂය ලෙස රු.133,400 ක් **ACA – 6** ආකෘතිය තුළ දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. | වැරදි නිවැරදි කිරීමට පියවර ගත යුතු බව. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ කාර්යය 2019 ජනවාරි 07 දිනෙන් ආරම්භ කර 2020 ජුලි 01 වන දිනෙන් අවසන් කළ යුතු කොන්ත්‍රාත්තුවක් වූ අතර, එහි ඉදිකිරීම් 2023 අප්‍රේල් මස දක්වා නිම කර නොතිබුණි. මෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය සියළු බදු ඇතුළත්ව රු.992,230,065 ක් විය. යථෝක්ත ප්‍රතිසංස්කරණ කාර්යය සී/ස මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්ගලික) සමාගම වෙතද, එහි උපදේශක කාර්යය ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙතද පවරා තිබුණි.<br>2022 දෙසැම්බර් 31 දිනට යථෝක්ත ඇස්තමේන්තු මුදලින් රු.435,747,176 ක මුදලක් උපයෝජනය කර තිබූ බවත්, තවද රු.8,205,900 ක මුදලක් නිම කළ කාර්යයන් වෙනුවෙන් ගෙවිය යුතුව පැවති බවත් නිරීක්ෂණය විය. ඒ අනුව පිරිවැය රු.443,953,076 ක එකතු වටිනාකමක් ප්‍රධාන ගොඩනැගිල්ල අලුත්වැඩියාව වෙනුවෙන් වැයකර තිබූ නමුත්, යථෝක්ත වටිනාකම 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ මූල්‍ය නොවන වත්කම් යටතේ දේපළ පිරියත හා උපකරණ වටිනාකම තුළ ඇතුළත් කර නොතිබූ බව නිරීක්ෂණය විය. තවද, ඉහත වටිනාකම වූ රු.443,953,076 ක් **ACA 6** වෙනුවට ඉදිරිපත් කරන නව **CIGAS** වෙබ් යෙදුම මඟින් ජනනය කරන ලද මූල්‍ය නොවන වත්කම් වාර්තාවෙහි ගොඩනැගිලි/9151 තුළද ඇතුළත් කර නොතිබුණි. එසේම 2012 වර්ෂය තුළ වැඩ නිම කළ දැනට කාර්යාල කටයුතු සඳහා භාවිතා කරන නව ගොඩනැගිල්ල පිරිවැයට හෝ තක්සේරු කළ අගයට ගණනය කර එහි වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර මධ්‍ය වායුසමන හා උසස් ආරක්ෂිත පද්ධතියක් ස්ථාපිත කිරීමට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර ඇතත්, එම කටයුතු මෙතෙක් අවසන් කර නොමැති අතර, අදාළ වියදම් වැය විෂය 209-02-02-2001 (ගොඩනැගිලි පුනරුත්ථාපනය කිරීම) යටතේ ඇතුළත් කර ඇත.<br><br>ඒ අනුව, ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් නොමැති බැවින්, එකී වියදම් 209-02-02-2101 වැය විෂය යටතේ ඉදිකිරීම් කටයුත්තක් ලෙස නොව, 209-02-02-2001 වැය විෂය යටතේ ප්‍රතිසංස්කරණ කටයුත්තක් ලෙස ගිණුම්ගත කරනු ලැබේ. එහි දී කළ වැඩ වටිනාකම, දේපළ පිරිවැය හා උපකරණ යටතේ වාර්තාගත නොවන අතර, ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් වූ පසු සමස්ත ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු කර ප්‍රාග්ධනිත කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ.<br><br>එමෙන්ම, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ නව ගොඩනැගිල්ලේ (**B** ගොඩනැගිල්ල) වටිනාකම තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපියක් මඟින් ඉල්ලුම් කර ඇති අතර, අදාළ කටයුතු අවසන් වූ පසු වටිනාකම ගිණුම්ගත කර, මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර දැක්වීමට කටයුතු කරමි. | ඉදිකිරීම් සඳහා දරන ලද වියදම කෙරීගෙන යන වැඩ යටතේ හෝ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ACA – 6) යටතේ සටහනක් මඟින් හෝ අනාවරණය කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයයන් 02 කට අදාළව සියයට 100 ප්‍රතිශතයකින් රු.850,000 ක ප්‍රතිපාදන ඉතිරි වී පැවතිණි. | දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂය වෙනුවෙන් වූ වැය විෂයන් 10 ට අදාළ ඉතිරිවීම අධි ඇස්තමේන්තුකරණය නිසාම සිදු වූයේය යන්න හා එකඟ විය නොහැක. | ඇස්තමේන්තු සැකසීමේ කටයුතු මනා සැලකිල්ලකින් යුතුව ඉටු කළ යුතු වන බව. |

### 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වෙමින්තර සුදුසු පරිදි අභ්‍ය . පාලනපද්ධතීන් සමාලෝචනය කර අදාළ වාර්තාවන් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ටෙරාබයිට් 500 ක ධාරිතාවයකින් යුක්ත ඩිජිටල් කෝෂ්ඨාගාරයක් පිහිටුවීමේ ව්‍යාපෘති යෝජනාව සඳහා 2021 අප්‍රේල් 05 දිනැති අංක අමප/21/0511/305/010-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලැබී තිබුණි. වසර 05 ක ව්‍යාපෘති කාලය සඳහා රු.120,208,320 ක ව්‍යාපෘති පිරිවැයක් ඇස්තමේන්තු කර පැවති අතර, ඒ අනුව 2021 සහ 2022 තුළ ව්‍යාපෘතියේ පළමු අදියර සඳහා තොරතුරු තාක්ෂණ, යටිතල පහසුකම්, මෘදුකාංග, කාර්ය මණ්ඩලයේ වාර්තා සංවර්ධනය, උපදේශන සේවා හා අවිනිශ්චිත වියදම් සඳහා බදු ඇතුළත්ව රු.92,906,820 ක්ද, 2023 සිට 2025 දක්වා සේවා හා නඩත්තු කාලසීමාව සඳහා රු.27,301,500 ක මුළු පිරිවැයක් ඇස්තමේන්තු කර තිබුණි.<br><br>උක්ත ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂයේ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.7,500,000 ක් ලෙස පැවතියද, 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘතියෙහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය ශුන්‍ය වේ. ව්‍යාපෘතියේ පළමු අදියරේ කටයුතු 2021 වර්ෂයේ සිදු කිරීමට ඇස්තමේන්තු කර තිබුණද, යථෝක්ත ව්‍යාපෘතියට අදාළ අනයෝන්‍ය අවබෝධතා ගිවිසුමේ කටයුතු අවසන් කිරීමට නොහැකිවීම හේතුවෙන් 2023 අප්‍රේල් 30 දක්වා ව්‍යාපෘති කටයුතු අවසන් කර නොතිබුණි. | ජාතික අයවැය චක්‍රලේඛ අංක හි 2022/03 ) 03iii) සහ )iv) වගන්ති ප්‍රකාරව මෙම ව්‍යාපෘතියේ කටයුතු තාවකාලිකව අත්හිටුවීමට සිදුවිය. වර්ෂය 2023 සඳහා මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. ක 80 තිපාදන අයවැය මඟින්ප්‍ර වෙන් කර දී ඇති අතර, මාගේ අංක DNA/15/ARO I/ 1/1 දරන හා 2021.06.28 දිනැති ලිපියට පිළිතුරු ලෙස බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක CA/NH/15/02/01/04 දරන හා දිනැති ලිපිය මඟින් 2023.02.15 අවබෝධතාන්‍යඅනෝන්‍ය ගිවිසුම අත්සන් කිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කරන ලෙස අනුමැතිය ලැබී ඇත. එම අනෝන්‍ය අවබෝධතා ගිවිසුම සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | ඩිජිටල් කෝෂ්ඨාගාරය පිහිටුවීමේ ව්‍යාපෘතියේ කටයුතු කඩිනමින් නිම කළ යුතු වන බව. |

## 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව දෙපාර්තමේන්තු CCTV කැමරා පද්ධතිය සවි කිරීමේ ව්‍යාපෘතියෙහි 2021 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදන ප්‍රගතියට අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිරිවිතර සකස් කර නොමැති බව දක්වා තිබූ අතර, 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියෙහි ප්‍රගතිය ලෙස තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිරිවිතර සකස් කරමින් පවතින බව නිරීක්ෂණය විය. මෙලෙස වසරකට පසුවත් අදාළ ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර නොතිබීම අභ්‍යන්තර කළමනාකරණ දුර්වලතාවයක් ලෙස නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ CCTV නඩත්තු හා සේවා ගිවිසුම් ගතවීම සඳහා මිල ගණන් කැඳවා ඇත. එනමුත්, CCTV ලබා ගැනීම සඳහා ඇස්තමේන්තුවක් සකසා ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර ඇති අතර, 03/2022 රාජ්‍ය වියදම් පාලනය කිරීමේ චක්‍රලේඛය අනුව ලද උපදෙස් මත වියදම් අවම කිරීමට සිදු විය. කෙසේ වෙතත්, මෙම වර්ෂයේ දී ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර මෙම කාර්යයන් නිමා කිරීමට අපේක්ෂා කරමි. | භාණ්ඩ මිල ගණන් සීඝ්‍රයෙන් වෙනස් වන නිසා ප්‍රසම්පාදන කටයුතු කඩිනමින් අවසන් කළ යුතු වන බව. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි පුළුල් කිරීම් යටතේ ඉදිකරනු ලැබූ නව ගොඩනැගිල්ල 2012 නොවැම්බර් මස විවෘත කර තිබූ අතර, 2013 වර්ෂයේදී VS Information System (Pvt) Ltd (VSIS) ආයතනය විසින් ගොඩනැගිල්ලේ CCTV පද්ධතිය ස්ථාපිත කර තිබුණි. කෙසේ වෙතත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 3.2 ප්‍රකාරව VSIS ආයතනය බලයලත් නියෝජිත ආයතනයක් නොවූ අතර, වගකීම් කාලය අවසන් වීමෙන් පසු නඩත්තු හා සේවා කටයුතු සඳහා දෙපාර්තමේන්තුව හා VSIS ආයතනය සමඟ සේවා ගිවිසුමක් නොතිබීම හේතුවෙන් CCTV පද්ධතියේ අළුත්වැඩියා කටයුතු ක්‍රමානුකූලව ක්‍රියාත්මක වී නොතිබුණි. | නව ගොඩනැගිල්ලේ ස්ථාපිත සියලුම පද්ධතීන් ස්ථාපනය කිරීම හා එහි ප්‍රසම්පාදන කටයුතු ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරු වූ CECB ආයතනය විසින් වන අතර VISIS ආයතනය විසින් අදාළ පද්ධතිය ස්ථාපිත කර ඇත. සවි කිරීමෙන් පසු වගකීම් කාලය අවසන් වූ පසු සේවා ගිවිසුමක් තිබී නොමැති අතර සේවා ගිවිසුම සඳහා ගෙවීම් සිදු කර නැත. මේ සඳහා වාර්ෂික නඩත්තු හා සේවා ලබා ගැනීම සඳහා ආයතන 05 කින් මිල ගණන් කැඳවා ඇත. | CCTV පද්ධතියේ අළුත්වැඩියා කටයුතු සිදු කළ යුතු වන බව. |

### 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 වර්ෂයේදී දෙපාර්තමේන්තු නව ගොඩනැගිල්ලේ ස්ථාන 23 ක CCTV කැමරා සවිකර තිබූ නමුත්, 2023 අප්‍රේල් විගණිත දින වන විට ක්‍රියාකාරී තත්ත්වයේ පවතින කැමරා සංඛ්‍යාව 09 ක් පමණක් විය. මෙම CCTV පද්ධතිය ස්ථාපනය කර වසර 10 කට වඩා කාලයක් ගතවී පැවතියද, එහි අඩුපාඩු හඳුනාගෙන නිවැරදි කිරීමට 2022 දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබීම හේතුවෙන් ජාතික වටිනාකමක් ඇති ලේඛන සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් සැපයීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | CCTV කැමරා පද්ධතිය අලුත්වැඩියාව කළ යුතු අතර මෙම වසර තුලදී අදාළ කාර්යය නිමා කිරීමට අපේක්ෂා කර ඇත. | ජාතික වටිනාකමක් ඇති ලේඛන සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් ආරක්ෂාවක් සැපයිය යුතු වන බව. |
| (ආ) | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තු අංක 4/14/5994 හා 2022 නොවැම්බර් 17 දිනැති ලිපිය මඟින් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම පරිහරණය සඳහා දෙපාර්තමේන්තුව වෙත නිදහස් කිරීමට අනුමැතිය ලබාදී තිබුණත්, 2023 මාර්තු වන විටත් අදාළ පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ඉඩම , දෙපාර්තමේන්තුව වෙත නිදහස් කිරීම ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති අතර, පවරා දීමට අදාළව භුක්තිය භාර දීමට අදාළ ඉදිරි කටයුතු සිදුවෙමින් පවතින බව තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් විසින් දැනුම් දෙන ලදී. පවරා ගැනීමේ කටයුතු සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරියකු නම් කර යවා ඇත. | ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩමේ පවරා ගැනීම් කටයුතු කඩිනමින් කළ යුතු වන බව. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම අංශයක් ලෙස පවත්වාගෙන යනු ලබන ලේඛන සංරක්ෂණ අංශයෙහි ලේඛන සංරක්ෂණ තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 27 ක් වුවද, මේ වන විට අංශය තුළ සේවකයින් 02 ක් පමණක් සේවයෙහි නිරත වේ. මේ තත්ත්වය අංශය තුළ දිගින් දිගටම පැවති තත්ත්වයක් බැවින් ලේඛන සංරක්ෂණ කටයුතු වලදී මෙම සේවක හිඟය මත විවිධ ගැටලු වලට මුහුණ පාන අතර, අංශය තුළ දෛනික රාජකාරී හා සමස්ථ කාර්ය සාධනයෙහි මන්දගාමී තත්ත්වයක් නිරූපණය විය. මෙලෙස සංරක්ෂණය කළ යුතු තත්ත්වයේ ඇති ලේඛන කලට වේලාවට සංරක්ෂණමය ක්‍රියාවලියට භාජනය නොකිරීම තුළින් මෙම ලියවිලිවල භෞතික තත්ත්වය දිනෙන් දින විනාශ වන අතර, රාජ්‍ය ලේඛන විධිමත් ලෙස කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවයටද අහිතකර ලෙස බලපෑම් ඇති වී පැවති බව නිරීක්ෂණය විය. | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු අනුමත කරන ලද තනතුරු සඳහා නව බඳවා ගැනීම් පටිපාටි සකස් කර ඇත. ඒ අනුව, නව බඳවා ගැනීම් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පැවති අතර, ජාතික අයවැය චක්‍රලේඛ අංක **03/2022** අනුව නව බඳවාගැනීම් සිදුකිරීම අත්හිටුවීම හේතුවෙන් එම කටයුතු තාවකාලිකව නතර කිරීමට සිදු විය. කෙසේ වෙතත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ හා රාජ්‍ය සේවයේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිලධාරි කමිටුවේ අනුමැතිය යටතේ නව බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කරමින් පවතී. | සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වන බව. |
| (ආ) ලේඛන සංරක්ෂණය සඳහා නෙදර්ලන්ත ආධාර යටතේ දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබූ ලේඛන සංරක්ෂණ යන්ත්‍ර 02 ක් හා දෙපාර්තමේන්තුව විසින් 2011 වර්ෂයේදී රු.5,040,000 ක **(VAT** සහිත) වටිනාකමකට මිලදීගෙන තිබූ යන්ත්‍රයක් ඇතුළු යන්ත්‍ර 03 ම වසර 02 ක පමණ කාලයක සිට ප්‍රමාණවත් පරිදි සේවකයින් නොමැති වීම නිසා නිශ්කාර්යයාව පවතින බව නිරීක්ෂණය විය. මෙලෙස සංරක්ෂණ යන්ත්‍ර සංරක්ෂණ කටයුත්ත සඳහා භෞතිකව යොදා නොගැනීම තුළින් එම යන්ත්‍ර වල ක්‍රියාකාරීත්වය සඳහා අහිතකර බලපෑම් ඇති වන අතර, සම්ප්‍රදායික සංරක්ෂණ ශිල්පීය ක්‍රමය යටතේ වැය වන | විගණන නිරීක්ෂණය හා එකඟ වෙමි. | සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වන බව. |

| | | |
|---|---|---|
| කාලය අවම කර ගැනීමේ හැකියාවද අවම වන බව නිරීක්ෂණය විය. | | |
| (ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 48 දරන ජාතික ලේඛනාරක්ෂක පනතෙහි 179 වෙනි අධිකාරිය ප්‍රකාරව අරමුණු හා කාර්යයන් අනුව මෙරට ප්‍රකාශයට පත් කරන ප්‍රකාශනවල සියලුම නීත්‍යානුකූල තැන්පතු කෝෂ්ඨාගාර ලෙස නියාමන කටයුතු සිදුකිරීමේ කාර්යයායේදී දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණාල පරීක්ෂාවක් සිදු කරනු ලබයි. 2023 ජනවාරි 04 වන විගණිත දිනය වන විටත් මුද්‍රණාල පරීක්ෂක ලෙස එක් නිලධාරිනියක පමණක් සේවයෙහි නිරතව සිටි අතර, මෙලෙස දීප ව්‍යාප්තව සිදු කරනු ලබන මුද්‍රණාල පරීක්ෂාවන් සඳහා එක් නිලධාරිනියක කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. තවද මේ හේතුවෙන් වසර 02 ක පමණ සිට දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණාල පරීක්ෂාවක් සිදු කර නොමැති අතර, වසර 10 ක පමණ සිට පනතට අනනුකූලවූ අවස්ථාවන් සඳහා නඩු පැවරීම් කටයුතුද සිදු කර නොතිබුණි. | මුද්‍රණාල පරීක්ෂාව සිදු කළ පසු මාසික වාර්තා යොමු කර නොමැති මුද්‍රණාල ශිල්පීන්ට එරෙහිව නඩු පැවරීම සඳහා අදාළ තොරතුරු ලබා දීමේ වගකීම පැවරී ඇත්තේ නාමාවලි සහකාර/නාමාවලි නිලධාරි තනතුරුවලටය. එම තනතුරු 09ක් අනුමතව තිබුණ ද දැනට සේවය කරනු ලබන්නේ නාමාවලි සහකාර එක් අයෙකු පමණි. එම නිලධාරියා දැනට ප්‍රකාශන සඳහා විෂය වර්ගීකරණය පමණක් සිදු කරයි. කෙසේමුත් සංවර්ධන නිලධාරින් තිදෙනෙකු අනුයුක්ත කර මෙම අංශයේ පුවත්පත් ආබද්ධ කර ගැනීමේ කටයුතු ද, ලදුපත් යොමු කිරීම, ප්‍රකාශන පරිගණකගත කිරීම් ආදිය සිදු කළ ද එය ද ප්‍රමාණවත් නොවේ. ඉදිරියේ දී මුද්‍රණාල පරීක්ෂකවරු සහ නාමාවලි නිලධාරි තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම තුළ මෙම තත්ත්වය අවම කිරීමට හැකිවනු ඇත. | සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වන බව. |
| (ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 66 දරන මුද්‍රණකරුවන්ගේ සහ ප්‍රකාශකයන් පිළිබඳ (සංශෝධන) පනතෙහි 2 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ මුද්‍රණය කරනු ලබන පුවත්පත්, සඟරා සහ පොත් වල පිටපත් 05 ක් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබාදිය යුතුව තිබුණි. ලියාපදිංචි සහ ලියාපදිංචි නොවන මුද්‍රණාල හා ප්‍රකාශකයන් විසින් මුද්‍රණය කරනු ලබන පුවත්පත්, සඟරා හා පොත් වල පිටපත් ක්‍රමවත්ව ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබාදීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. මුද්‍රණකරුවන් සහ ප්‍රකාශකයින් ඔවුන්ගේ ප්‍රකාශන සහ විස්තර පත්‍රිකා නිසි පරිදි භාර දීමට කටයුතු නොකරන අවස්ථාවල දී සිදුවිය හැකි අවදානම අවම කිරීම සඳහා පියවර ගෙන ඇත. | 1976 අංක 66 දරන මුද්‍රණකරුවන්ගේ සහ ප්‍රකාශකයන් පිළිබඳ (සංශෝධන) පනතෙහි විධි විධාන අනුව කටයුතු කළ යුතු වන බව. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළව ප්‍රධාන කෝෂ්ඨාගාර 09 ක් පවතින අතර, ඒ අතුරින් කෝෂ්ඨාගාර 02 ක් එනම්, **DNA 07** රහස්‍ය ලේඛන අංශය හා **DNA**/19/**A/2** කෝෂ්ඨාගාරය 2022 මාර්තු මස සිට 2023 ජනවාරි 04 විගණිත දින දක්වා මාස 10 ක කාලයක් මුද්‍රා තබා පැවති බව නිරීක්ෂණය විය. රහස්‍ය අංශයට අයත් නව සහ පැරණි ගොඩනැගිල්ලේ රහස්‍ය කාමර වල තැන්පත් ලේඛන කාණ්ඩ 200 ට අධික වන අතර, එසේම **DNA**/19/**A/2** කෝෂ්ඨාගාරය තුළ ලේඛන කාණ්ඩ 15 ක් තැන්පත් කර පැවතිණි. අදාළ කෝෂ්ඨාගාර 02 තුළ රහස්‍ය ලේඛන සහ ලන්දේසි ලේඛන අන්තර්ගත විය. මුද්‍රා තබන ලද කෝෂ්ඨාගාර තුළ සුරක්ෂිතව තැන්පත් කර ඇති ලේඛන පරිශීලකයින්ට ලබාදීම, පිටපත් නිකුත් කිරීම, අධිකරණ කටයුතු හෝ වෙනත් රාජ්‍ය ආයතන සඳහා තොරතුරු ලබාදීම ඇතුළු කටයුතු සඳහා අවශ්‍යතාවය මත අවස්ථා කිහිපයකදී මුද්‍රා තබන ලද කෝෂ්ඨාගාර විවෘත කර තිබුණි. මෙලෙස වසරකට ආසන්න කාලයක් කෝෂ්ඨාගාර වසා තැබීම හේතුවෙන් එහි අන්තර්ගත රහස්‍ය සහ ලන්දේසි ලේඛන වල පැවැත්මට අදාළ උෂ්ණත්වය, ආර්ද්‍රතාවය, අනෙකුත් රසායනික හා පාරිසරික සාධක සහ ආරක්ෂාව පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් ඇතිවී පැවති බව නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. පැරණි ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු හේතුවෙන් විදුලිය විසන්ධි කිරීම සහ වායුසමන පද්ධතීන් ක්‍රියාත්මක නොවීම පෙර සිටම පැවති තත්ත්වයක් වන අතර, නව ගොඩනැගිල්ලේ මධ්‍ය වායුසමන පද්ධතියක් ක්‍රියාත්මක වීම හේතුවෙන් 2022 වර්ෂයේ දී සේවයට වාර්තා කිරීම සීමා කිරීම මඟින් කෝෂ්ඨාගාරවල ප්‍රශස්ත පාරිසරික තත්ත්වයන් පවත්වාගෙනයාම කෙරෙහි විශාල බලපෑමක් සිදු නොවුණි. මෙම කාලය තුළ අවසරලත් නිලධරයන් හට පමණක් අදාළ කෝෂ්ඨාගාර තුළට ප්‍රවේශ වීමට ඉඩ ලබා දුන් බැවින් ලේඛනවල සංරක්ෂණය සඳහා කරනු ලබන දෛනික පිරිසිදු කිරීම්, කෝෂ්ඨාගාර පරීක්ෂාව, ආර්ද්‍රතා පාලන යන්ත්‍ර පරීක්ෂා කිරීම ආදී කාර්යයන් මෙම කාලය තුළ නිසි ආකාරයට සිදු නොවීය. වර්තමානයේ දී අවශ්‍ය සංරක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. | කෝෂ්ඨාගාර වල ඇතිවී ඇති ගැටලු නිරාකරණය කළ යුතු වන බව. |

## 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 ජනවාරි 12 දින සහ අංක **DMA/01-2019** දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 5.3 ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට එක බැගින් අවම රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කිසිදු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි. | 2023 වර්ෂයේ පෙබරවාරි මස 15 දින පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී 2022 අවසන් කාර්තුව සඳහා වූ කරුණු ද සාකච්ඡාවට ගෙන ඇත | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වන බව. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක **DMS/1135/VOL – I** හා 2016 සැප්තැම්බර් මස 15 හා සමාංක 2017 පෙබරවාරි 08 හා සමාංක 2017 පෙබරවාරි 17 සහ සමාංක 2017 අප්‍රේල් 28 දිනැති ලිපි මඟින් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමෙන් අනතුරුව දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 286 ක් ලෙසට අනුමත කර තිබුණි. එයින් විගණිත දිනය වූ 2022 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය 133 ක් වූ අතර, එය සමස්ථ කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාවෙන් සියයට 47 කි. තවද, එදිනට පුරප්පාඩු සේවක සංඛ්‍යාව 153 ක් වූ අතර, එය සමස්ථ සේවක සංඛ්‍යාවෙන් සියයට 53 කි. මෙලෙස දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 50 කට අධික සේවක සංඛ්‍යාවක් පුරප්පාඩුව | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු අනුමත කරන ලද තනතුරු සඳහා නව බඳවා ගැනීම් පටිපාටි සකස් කර ඇත. ඒ අනුව, නව බඳවා ගැනීම් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පැවති අතර, ජාතික අයවැය චක්‍රලේඛ අංක **03/2022** අනුව නව බඳවාගැනීම් සිදුකිරීම අත්හිටුවීම හේතුවෙන් එම කටයුතු තාවකාලිකව නතර කිරීමට සිදු විය. කෙසේ වෙතත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ හා රාජ්‍ය සේවයේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිලධාරි කමිටුවේ අනුමැතිය යටතේ නව බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කරමින් පවතී. | සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වන බව. |

| | | | |
|---|---|---|---|
| | පැවතීම තුළින් දෙපාර්තමේන්තුව ඉදිරියේදී පවත්වාගෙන යාම හා සමස්ථ කාර්ය සාධනය ලඟා කර ගැනීමට ඇති හැකියාව අවම මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | දෙපාර්තමේන්තු ජ්‍යෝෂ්ඨ මට්ටමේ තනතුරු වලින් සියයට 50 ක්ද, ද්වීතියික මට්ටමේ තනතුරු වලින් සියයට 75 ක්ද හා තෘතියික මට්ටමේ තනතුරු වලින් සියයට 68 ක්ද පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය වූ අතර, මෙලෙස පවතින වෘත්තීය නිලධාරීන්ගේ දැඩි හිඟය 2021 වර්ෂයට පෙර සිටම පැවත එන බව නිරීක්ෂණය විය. මෙලෙස දෙපාර්තමේන්තුගත වෘත්තීය නිලධාරීන් බඳවා ගැනීම සිදු නොකිරීමත්, දැනට සිටින වෘත්තීය දැනුමැති සේවකයින් විශ්‍රාම ගැනීමෙන් පසු දෙපාර්තමේන්තුවටම ආවේණික කාර්යයන් ඉටු කිරීම සඳහා දැනුමෙන් සන්නද්ධ පසු පෙළක් නිර්මාණය නොවීමත් මත ලේඛන කළමනාකරණයට හා අධි ලේඛන කළමනාකරණයටද එම කාර්යයන් වල ප්‍රමාදයන් සඳහාද බලපෑම් ඇති වී තිබූ බව නිරීක්ෂණය විය. | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු අනුමත කරන ලද තනතුරු සඳහා නව බඳවා ගැනීම් පටිපාටි සකස් කර ඇත. ඒ අනුව, නව බඳවා ගැනීම් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පැවති අතර, ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව නව බඳවාගැනීම් සිදුකිරීම අත්හිටුවීම හේතුවෙන් එම කටයුතු තාවකාලිකව නතර කිරීමට සිදු විය. කෙසේ වෙතත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ හා රාජ්‍ය සේවයේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිලධාරි කමිටුවේ අනුමැතිය යටතේ නව බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කරමින් පවතී. | සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වන බව. |